(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 329.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2013 දෙසැම්බර් මස 14 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1949/’11

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට අයත් නක්කල සති පොළ මීට වර්ෂයකට පමණ පෙර විවෘත කළ බවත්;

(ii) විවිධ පුද්ගලයන්ගේ බලපෑම් නිසා මේ වන විට වෙළෙඳුන්ට එහි පැමිණ වෙළඳාම් කිරීමට නොහැකිවී ඇති බවත්;

(iii) ඒ නිසාම සති පොළ පාළුවට ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නක්කල සති පොළෙහි පවත්නා මෙම තත්ත්වය මගහරවා වෙළෙඳුන්ට නිදහසේ වෙළඳාම් කිරීමටත් ඔවුන්ට ආරක්ෂාව සම්බන්ධයෙන් පවත්නා ගැටලු විසඳා දීමටත් කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2318/’12

2.

ගරු රවි කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2011 වර්ෂයට අදාළව,

(i) නිවාස ඉදි කිරීම වෙනුවෙන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ඉදි කරනු ලැබ ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012 වර්ෂයට අදාළව,

(i) නිවාස සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වන විට ඒ සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) අලුතින් ඉදි කරන ලද නිවාස පිහිටා ඇති ස්ථාන කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2371/'12

3.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ තැලසීමියා රෝගය ව්‍යාප්තව පවතින දිස්ත්‍රික්ක කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2011 දක්වා වාර්තා වී ඇති තැලසීමියා රෝගීන් සංඛ්‍යාව හා මරණ සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට තැලසීමියා රෝගය ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කවල වෙසෙන සමස්ත තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වැඩිම තැලසීමියා රෝගීන් සංඛ්‍යාවක් සිටින සහ එම රෝගයෙන් වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තා වන දිස්ත්‍රික්කය කවරේද;

(v) එම මරණ සංඛ්‍යාව කොපමණද;

(vi) එම දිස්ත්‍රික්කයේ සිටින තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තැලසීමියා රෝගය සඳහා ස්ථිර ප්‍රතිකාර ක්‍රමයක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමය ලංකාවේ ක්‍රියාත්මක වන්නේද;

(iii) තැලසීමියා රෝගීන් සඳහා ලබා දෙන එන්නත් වර්ගය කවරේද;

(iv) එම එන්නත ආනයනය කරන රට කවරේද;

(v) එන්නත් ආනයනය සඳහා වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3427/'13

4.

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජල ගැලීම් නිසා හානියට පත් එළවළු, පලතුරු හා ධාන්‍ය වගාවන් වෙනුවෙන් ඒවා වගා කළ ගොවීන්ට ආධාර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, අක්කරයක් සඳහා ලබා දෙන වන්දි මුදල කොපමණද;

(iii) එසේ වන්දි ගෙවීමක් සිදු නොකරන්නේ නම්, එම ගොවීන්ට ලබා දෙන සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3900/'13

5.

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 මාර්තු හා අප්‍රේල් මාසවලදී රජයේ රෝහල්වල ඇති වූ දැඩි ඖෂධ හිඟය පිළිබඳව දන්නේද;

(ii) එම කාල සීමාවේදී හිඟ වූ ඖෂධ කවරේද;

(iii) ඉහත ඖෂධවල හිඟය පැවති රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත මාස 2 තුළ දී රජයේ රෝහල්වල දිනකට මියගිය රෝගීන්ගේ ප්‍රතිශතය කොපමණද;

(v) ඉහත කාල සීමාවේදී මහරගම පිළිකා රෝහලට අවශ්‍ය වූ ඖෂධවලින් නොලැබුණු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1955/'11

6.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලයට පෞද්ගලික හිමිකරුවකු විසින් වර්ෂ තුනකට පමණ පෙර පරිත්‍යාග කරන ලද අම්බලන්ගොඩ විලේගොඩ පිහිටි තෙමහල් නිවස මේ දක්වා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන දිරාපත් වෙමින් පවතින බවත්;

(ii) අබලන් තත්ත්වයේ පවතින ඉහත නිවස පාසලේ අධ්‍යාපනය ලබන සිසුවියන්ගේ ජීවිතවලට තර්ජනයක්ව ඇති බවත්;

(iii) එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර එම ස්ථානයේ රැස්වීම් ශාලාවක් ඉදි කර දෙන ලෙස විදුහල්පතිතුමිය විසින් අවස්ථා ගණනාවක දී අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිතුමියගේ ඉහත ඉල්ලීම අනුව කටයුතු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, එම ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2322/'12

7.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂයන්හි පළාත් සභා 9 සඳහා වෙන් කොට තිබූ සමස්ත අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත කී වර්ෂයන් තුළ අරමුදල් ලබා දී ඇති, එක් එක් පළාත් සභාවට අයත් අමාත්‍යාංශයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2010, 2011 සහ 2012 වර්ෂයන්හිදී,

(i) එක් එක් පළාත් සභාව විසින්, රජයේ ප්‍රතිපාදනවලින් වියදම් කොට තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) පළාත් සභාව විසින්ම උපයාගත් මුදලින් කළ වියදම්වල වටිනාකම කොපමණද;

(iii) රජයේ ප්‍රදානයන් සහ ආදායම් බෙදා ගැනීම් ලෙස එක් එක් පළාත් සභාව විසින් ලබා ගන්නා ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එක් එක් පළාත් සභාවන්හි අයවැය අවශ්‍යතාවන්හි හිඟය පියවා ගන්නා ආකාරය කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) ඉහත කී පළාත් සභාවන්ට මධ්‍යම ආණ්ඩුව සතු බලතල ලබා දීමෙන් අනතුරුව, පළාත් සභාවන්හි ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2437/'12

8.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල වැඩ ආවරණය කරනු ලබන වැඩ බලන අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ,

(i) සංඛ්‍යාව කොපමණද;

(ii) නම් හා වත්මන් සේවා ස්ථාන කවරේද;

(iii) පත්වීම් සිදු කිරීමට පෙර ඒ සඳහා අයදුම්පත් කැඳවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වැඩ බලන අධ්‍යක්ෂවරුන් ලෙස පත්වීම් ලද අයගේ,

(i) පෙර සේවා ස්ථාන කවරේද;

(ii) ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පන්ති හා ශ්‍රේණි කවරේද;

(iii) වෘත්තීය හා ශාස්ත්‍රීය සුදුසුකම් කවරේද;

(iv) පත්වීම් සිදු කරන ලද්දේ කවරකු විසින්ද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව පරිදි අධ්‍යක්ෂ තනතුරුවල වැඩ ආවරණය කරන නිලධාරීන් පත් කිරීමට නොහැකි බවත්;

(ii) එම සේවයේ තනතුරු සඳහා වැඩබැලීමේ පත්වීම් ලබා දීමට හැක්කේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පමණක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මේ වනවිට ඉහත සේවයේ ඇති නිත්‍ය තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා සේවා ව්‍යවස්ථාව අනුව ගැසට් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවා, සුදුසු නිලධාරීන් බඳවා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2684/'12

9\.
ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "දැයට කිරුළ" ප්‍රදර්ශනයෙහි සංකල්පය එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා පැවැත්වූ එක් එක් දැයට කිරුළ ප්‍රදර්ශනයෙන් ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාවන් කවරේද;

(iii) ඒවා ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත රැකියාද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුරයෙහි පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සත්‍ය වශයෙන්ම මුදල් වැය කළ වැය ශීර්ෂය කවරේද;

(ii) අවසන් වරට පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා කිසිදු ගෙවීමකින් තොරව ලබා ගත් ඇතැම් වත්කම් සහ ශ්‍රමය, එනම් සන්නද්ධ හමුදාවන්හි පුද්ගලයන් හෝ ශ්‍රමය සහ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙහි බස්රථ වැනි දෑ සම්පූර්ණ පිරිවැය ගණනය කිරීමේදී පිරිවැය සංරචකයන්හි ඇතුළත් කොට තිබේද;

(iii) එසේ නොමැති නම්, ඉහත කී ප්‍රදර්ශනය සඳහා මුළු පිරිවැය ගණනය කළ ආකාරය කවරේද;

(iv) පැවැත්වීමට නියමිත මීළඟ දැයට කිරුළ ප්‍රදර්ශනය තුන සඳහා අපේක්ෂිත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2511/'12

10\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිරිසිදු පානීය නල ජල සැපයුමක් ඇති ගම්මාන කවරේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිරිසිදු පානීය නල ජල සැපයුම නොමැති ගම්මාන කවරේද;

(iii) එම ගම්මානවලට පිරිසිදු පානීය ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර කාල වකවානුවක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2014) — (දහනවවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 13 වැනි දින ප්‍රගතිය)

*2.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2013.12.05 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ බහරේන් රාජධානියේ ආණ්ඩුව අතර, 2011 ජූනි මස 24 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වැනි වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ධසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ධසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

11.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

අල් ජමියාතුල් හ්හවිසියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

15.

මෛත්‍රීපාල සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

16.

හැන්ඩ්ස් ෆෝ එඩියුකේෂන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2014) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---